# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 111/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 22/01/2024<br>පැය 0605 |

## මාධ්‍ය නිවේදනය

**නීති විරෝධී වත්කම් ඉපයීම් සම්බන්ධව යතුරු පැදියක් සහ ලොරි රථයක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට – නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයෙන් කරන ලද පැමිණිල්ලක් මත නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් නීති විරෝධී ලෙස උපයාගත් වත්කම් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර 2024.01.21 වන දින අහුන්ගල්ල පොලිස් වසමේ වැලිකන්ද ප්‍රදේශයේදී නීති විරෝධී ලෙස උපයාගත් මුදල් වලින් ලබා ගත් **යතුරු පැදියක් සහ ග්‍රීසරයක් සහිත ලොරි රථයක් සමඟ සැකකාරියක්** අත්අඩංගුවට ගෙන අහුන්ගල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 39 ක් වන අහුන්ගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.